පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 08 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ඉතිහාසය

පාසලේ නම : ..................................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................ කාලය : පැය දෙකයි

**1 - කොටසේ සියළුම ප්‍රශ්න සදහා පිළිතුරු සපයන්න**

**2 කොටසින් පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න**

1) මහා වංශයේ සදහන් පරිදි පණ්ඩුකාභය රජු විසින් ඉදි කළ වාරි කර්මාන්ත දෙකක් වන්නේ

i.ජයවාපි හා ජල්ලුරු වාපි.
ii.ගාමිණි වාපි හා අභය වාපි
iii.මහානික්කවට්ටි වාපි හා මයෙත් වාපි
iv ගාමිණී වාපි හා බානු වාපි

2) මෙම දිවයිනේ වැස්සෙන් ලැබෙන ජලය මදකුත් ලෝකෝපාකාරයෙන් තොරව මුහුදට නොයේවා යන ආදර්ශ පාඨයට අනුව කටයුතු කළ රජු කවුද ?

i. දුටු ගැමුණු රජු
ii. දේවානම්පිය තිස්ස රජු
iii. පණ්ඩුකාභය රජු
iv. මහා පරාක්‍රමබාහු රජු

3) ස්වභාවික සුළං බලය යොදාගෙන ගිනි දල්වමින් යකඩ නිස්සාරණය කළ උදුනක් හමු වූ ස්ථානය වන්නේ

i. දෙහිගහ ඇළ කන්ද ප්‍රදේශය
ii. අලකොලවැව ප්‍රදේශය
iii. සමනල වැව ප්‍රදේශයේ කඳු මුදුනකින්
iv. අනුරාධපුර ප්‍රදේශයෙන්

4) රජරට සමයට අයත් වට දා ගෙවල් අතරින් කලාත්මක වටදා ගෙය ලෙස සැළකෙනුයේ

i. මැදිරිගිරිය වටදා ගෙයයි.
ii. තිරියාය වටදා ගෙයයි.
iii. ථූපාරාම වටදා ගෙයයි.
iv. ලංකාරාම වටදා ගෙයයි.

5) උඩරට රාජධානිය කෝට්ටේ රාජ්‍යයේ පාලන බලයෙන් නිදහස් සිංහ රජුකොටගෙන ස්වාධීන රාජ්‍යයක් බවට පත්කර ගත් උඩරට පාලකයා වන්නේ

i. ජයවීර බණ්ඩාර රජු
ii. සේනා සම්මත වික්‍රමබාහු රජු
iii. කරල්ලියද්දේ බණ්ඩාර රජු
iv. පළමුවන රාජසිංහ රජු

6) උඩරට රාජ්‍යයේ බලයට පත් වූ පළමු නායක්කාර් වංශික රජතුමා කවුරුන්ද ?

i. කිර්ති ශ්‍රී රාජසිංහ රජු
ii. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජු
iii. රාජාධී රාජසිංහ රජු
iv. ශ්‍රී විජය රාජසිංහ රජු

7) ගම්පොළ යුගයේ ඉදිකරන ලද ඇම්බැක්කේ දේවාලය වඩාත් ප්‍රසිද්ධියට පත් වන්නේ එහි ඇති

i. ගල් කැටයම් නිසයි
ii. විචිත්‍රවත් ලී කැටයම් නිසයි
iii. කතරගම දෙවියන් උදෙසා ඉදි වූ දේවාලයක් නිසයි
iv. පිත්තල බඳුන් දක්නට තිබෙන නිසාවෙනි.

8) මහනුවර යුගයට අයත් චිත්‍ර දක්නට ලැබෙන ස්ථාන පමණක් අඩංගු පිළිතුර තෝරන්න .

i. මුල්ගිරි ගල දඹුල්ල සීගිරිය
ii. දඹුල්ල පොළොන්නරුව දෙගල්දොරුව
iii. දළදා මාළිගය දඹදෙණිය දඹුල්ල
iv. දෙගල්දොරුව දළදා මාළිගය මුල්ගිරිගල

9) උඩරට රාජ්‍යත්වය හිමි කරගත් 1 වන විමල ධර්ම සූරිය රජු විවාහ කරගත් රජ කුමරිය කවුරුන්ද ?

i. සුනේත්‍රා දේවිය
ii. කුසුමාසන දේවිය
iii. බිසෝ බණ්ඩාර දේවිය
iv. උලකුඩය දේවිය

10) පුනරුදය මුලින්ම ආරම්භ වූයේ

i. ඉතාලියේය.
ii. ප්‍රංශයේය
iii. එංගලන්තයේය.
iv. ඇමරිකාවේය.

11) මොනාලිසා සහ අවසන් රාත්‍රි භෝජන සංග්‍රහය නම් ලෝක ප්‍රකට චිත්‍ර නිර්මාණය කළ චිත්‍ර ශිල්පියා කවුරුන්ද

i. මයිකල් ආන්ජිලෝ
ii. ලියනාඩෝ ඩා වින්චි
iii. පැබ්ලෝ පිකාසෝ
iv. චාර්ල්ස්

12) පුනරුදයේ ව්‍යාප්තියට විශාල රුකුලක් වූ මුද්‍රණ යන්ත්‍රය නිර්මාණය කළ පුද්ගලයා වන්නේ

i. ජොහැන්නස් ගුටෙන්බර්ග්
ii. ජොහැන්නස් කේප්ලර්
iii. මයිකල් සර්වෙටස්
iv. නිකලස් කොපර්නිකස්

13) "ක්‍රිස්තියානීන් හා කුළුබඩු සොයා අපි මෙහි පැමිණියෙමු." යන ප්‍රකාශය කළ නාවිකයා වන්නේ

i. ක්‍රිස්ටෝපර් කොලොම්බස්
ii. වස්කෝ ද ගාමා
iii. පර්ඩිනන්ඩ් මැගලන්
iv. බර්තොලමියු ඩයස්

14) පහත 1 තීරුවේ දක්වා ඇති විශ්ව විද්‍යාලය පිහිට වූ රට 11 තීරුවේ දක්වා ඇත. 1 හා 11 තීරු නිවැරදිව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| 1 තීරුව | 11 තීරුව |
|---|---|
| 1 පාදූවා | A එන්ගලන්තය |
| 2 පැරිස් | B ඉතාලිය |
| 3 කේම්බ්‍රිජ් | C ප්‍රංශය |

i. B C A    ii. C B A    iii. A C B    iv. B A C

15) පළමු වරට ලෝකය වටා ගමන් කිරීම තුළින් ලෝකය ගෝලාකාර බව තහවුරු කළ නාවික කණ්ඩායමේ ප්‍රධානියා වූයේ

i. ජැක්මීස් කාටියර්    iii. පර්ඩිනන්ඩ් මැගලන්

ii. හෙන්රි හඩ්සන්    iv. බර්තොලමියු ඩයස්

16) උඩරට රාජධානි සමයේ ශ්‍රී ලංකාවට ආනයනය කළ ද්‍රව්‍යයක් නොවන්නේ මින් කුමක්ද ?

i. අශ්වයින්    iii. පිගන් භාණ්ඩ

ii. රෙදිපිළි    iv. මැණික්

17) පෘතුගීසීන්ට විරුද්ධ සටන් වලදී ඉන්දියාවේ කැලිකට් හි සැමොරින්ගේ සහය ලබා ගත් සීතාවක පාලකයා වනුයේ මින් කවරෙක්ද ?

i. ධර්මපාල රජු    iii. හත්වන භුවනෙකබාහු රජු

ii. මායාදුන්නේ රජු    iv. හයවන පරාක්‍රමබාහු රජු

18) පළමුවන විමල ධර්ම සූරිය රජු හා පෘතුගීසීන් අතර බලන දී පැවති සටනේදී පෘතුගීසි හමුදා ප්‍රධානියා ලෙස කටයුතු කළේ

i. කොන්ස්තන්තිනූ ද සා    iii. පේරෝ ලෝපේස් ද සූසා

ii. දියෝගෝ ද මේලෝ    iv. දොන් ජෙරනිමෝ ද අසවේදූ

19) ක්‍රි. ව. 1597 දී අත්සන් කළ ඓතිහාසික මල්වාන ගිවිසුම යනු කුමක්ද?

i. එතෙක් කෝට්ටේ රාජ්‍යයේ පැවති පරිපාලන ක්‍රමය තවදුරටත් ගෙන යායුතු බව දැක්වෙන ගිවිසුම
ii. අළුතින් උසාවි ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා ගිවිසුම
iii. දිසා හතරකට බෙදා තිබූ කෝට්ටේ රාජ්‍යය එක් දිශාවක් බවට පත් කිරීම පිළිබඳ ගිවිසුම
iv. කෝට්ටේ රාජධානියේ ප්‍රදානීන් කෝරලේ විදානේ බවට නම් කළ ගිවිසුම

20 )පෘතුගීසීන් යටතේ මහබද්දේ දෙපාර්තමේන්තුව පිහිට වූයේ කුමන වාණිජ බෝගය හා සම්බන්ධව කටයුතු කිරීමටද ?

i. තේ
ii. රබර්
iii. කුරුඳු
iv. ගම්මිරිස්

( ලකුණු $2 \times 20$ = 40 යි )

## 2 - කොටස

පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වන අතර ප්‍රශ්න අංක 2 සිට 7 දක්වා ඇති ප්‍රශ්න අතරින් හතරකට පමණක් පිළිතුරු සපයන්න

1) ( අ ) පහත සඳහන් ස්ථාන දී ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ ලකුණු කර නම් කරන්න

කැළණි ගඟ / කෝට්ටේ/ හුරුළු වැව / ගෝකණ්ණ තිත්ථ/ පරාක්‍රම සමුද්‍රය/ සීගිරිය (ලකුණු 1 × 6 = 6යි )

( ආ) පහත සඳහන් පින්තූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න



i. පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?
ii. එය පිහිටා ඇත්තේ කොහේද?
iii. මෙය ඉදිකළායැයි සැලකෙන රජු කවුද?



i. මෙම පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා කවුරුන්ද?
ii. ඔහු කුමන ජාතිකයෙක්ද ?
iii. ඔහු වැදගත් විමට හේතුව කුමක්ද?

( ලකුණු 3× 2 = 6 යි )

2)

i. පහත දැක්වෙන්නේ වැවක ප්‍රධාන අංග දෙකකි .එම අංග වලින් ඉටුවන කාර්යයන් මොනවාදැයි ලියා දක්වන්න.

A බිසෝ කොටුව B පිට වාන ( ලකුණු 2 )

ii. පහත සඳහන් ඇල මාර්ග ඉදිකළ රජවරු කවුරුන්දැයි A B ලියා දක්වන්න.

A යෝධ ඇල

B මිනිපේ ඇල ( ලකුණු 2 )

iii. දීර්ඝ ඇලමාර්ග තැනවීමට ආදි ලාංකිකයා පෙළඹීමට බලපෑ හේතු තුනක් දක්වන්න ( ලකුණු 3 යි )

iv.ජල උද්‍යාන වල කැපී පෙනෙන ලක්ෂණ තුනක දක්වා ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. ( ලකුණු 5 යි )

3)

i.මහනුවර රාජධානිය හැඳින්වීමට භාවිතා කළ වෙනත් නම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2 යි )

ii. සුදුසු පරිදි නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

උඩරට ප්‍රභුවරයෙකු වූ ..........................................මුදලි තුමා එවකට සීතාවක පාලකයා වූ ......................................ට උඩරට යටත් කර ගැනිමට උදව් කළේය. ( වීරසුන්දර බණ්ඩාර / යමසිංහ බණ්ඩාර / පළමුවන රාජසිංහ රජු / දෙවන රාජසිංහ රජු ) ( ලකුණු 2 යි )

iii.රට රාජධානියේ රජ කළ නායක්කාර් වංශික රජවරුන් තිදෙනෙකු නම් කරන්න. ( ලකුණු 3 යි )

iv.පළමුවන විමල ධර්ම සූරිය රජතුමාට මුහුණ දීමට සිදු වූ අභියෝග තුනක් දක්වා ඉන් එක් අභියෝගයක් ජය ගැනිමට ක්‍රියා කළ ආකාරය පැහැදිලි කරන්න. ( ලකුණු 5 යි )

4)

i. පළමුවන විමල ධර්ම සූරිය රජුගෙන් ඇරඹී නව රාජ වංශයට අයත් රජවරු දෙදෙනෙකු නම් කරන්න. ( ලකුණු 2 යි )

ii. රන්දෙණිවෙල හා ගන්නෝරුව යන ස්ථාන වලදී උඩරට රාජධානිය හා පෘතුගීසීන් අතර පැවති සටන් වලදී නායකත්වය ගත් පෘතුගීසි සෙන්පතියන් නම් කරන්න. ( ලකුණු 2 )

iii.කීර්ති ශ්‍රී රාජසිංහ රජු බුදු දහමේ දියුණුව වෙනුවෙන් කටයුතු කළ ආකාරය පිළිබඳව තොරතුරු කෙටියෙන් ලියන්න. ( ලකුණු **3**)

iv.උඩරට රාජධනි සමයේ පැවති ආර්ථික රටාව පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. **(** ලකුණු 5 )

5)

i. පුනරුද සමයේ ඉතාලියේ පැවති දියුණු වෙළෙඳ නගර දෙකක් නම් කරන්න (ලකුණු 2 )

ii. පහත සඳහන් ගත් කතුවරුන් වාසය කළ රටවල් මොනවාද ?

a විලියම් ශේක්ෂ්පියර්

b අලිගියර් ඩාන්ටේ (ලකුණු 2 යි)

iii. පුනරුද සමයේ කලා ශිල්පයන්හි ඇති වූ වෙනස් කම් තුනක් ලියා දක්වන්න. (ලකුණු 3යි )

iv. පුනරුදයත් සම.ග වෛද්‍ය විද්‍යාවේ ඇති වූ දියුණුව පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5යි )

6)

i. පුනරුදයත් සමග දේශ ගවේෂණ කටයුතු සඳහා අනුග්‍රහය දැක්වූ රටවල් දෙකක් නම් කරන්න (ලකුණු 2 යි )

ii. ආසියාවට පැමිණි යුරෝපා ජාතීන් අයත් රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 2 යි )

iii. යුරෝපීයන් දේශ ගවේෂණට යොමු වීමට බල පෑ හේතු තුනක් ලියා දක්වන්න. (ලකුණු 3 යි )

iv. පුනරුදයත් සමග දේශ ගවේෂණයට සුදුසු පසුබිමක් යුරෝපය තුළ ගොඩනැගී තිබුණි. මෙම ප්‍රකාශය තහවුරු කිරිමට කරුණු තුනක් ලියා දක්වන්න. ( ලකුණු5 යි )

7)

i.a 1505 දී පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා ලෙස පත්ව ආ සෙන්පතියා

b ශ්‍රී ලංකාවට ගොඩ බට මුල්ම පෘතුගීසි ජාතිකයා කවුරුන්දැයි ලියන්න (ලකුණු 2 යි )

ii. පෘතුගීසීන් මෙරටට පැමිණි අවධියේ බෙදී පැවති ප්‍රධාන රාජ්‍යයන් අතරින්

a කෝට්ටේ b කන්ද උඩරට පාලනය කළ පාලකයින් වරහන් තුළින් තෝරා ලියන්න. (ලකුණු 2 යි )

( අටවන වීර පරාක්‍රමබාහු රජු / හත්වන භුවනෙකබාහු / සේනා සම්මත වික්‍රමබාහු / ජයවීර බණ්ඩාර )


iii.සීතාවක රාජධානියේ දියුණුවට හේතු වූ කරුණු තුනක් ලියා දක්වන්න ( ලකුණු 3 යි )

iv.පෘතුගීසීන්ගෙන් මෙරට සංස්කෘතියට එකතු වූ නවාංගයන් මොනවාදැයි පහත දැක්වෙන අංශ යටතේ ලියා දක්වන්න.

| | අංශය | නවාංග |
|---|---|---|
| 1 | ඇඳුම් | |
| 2 | ආහාර | |
| 3 | කලාව | |
| 4 | පුද්ගල නාම | |
| 5 | සංගීතය | |

(ලකුණු 5 යි )

පලමුවන ප්‍රශ්නයේ ( අ ) කොටසට පිළිතුරු සැපයීමට මෙම සිතියම භාවිතා කරන්න




2023 3 වන වාර පරීක්ෂණය උතුරු මැද පළාත

1) ගාමිණි වාපි හා අභය වාපි
2) මහා පරාක්‍රමබාහු රජු
3) සමනලවැව ප්‍රදේශයේ කඳු මුදුනකින්
4) මැදිරිගිරිය වට දාගෙය
5) සේනා සම්මත වික්‍රමබාහු රජු
6) ශ්‍රී විජය රාජසිංහ රජු
7) විචිත්‍රවත් ලි කැටයම් නිසා
8) දෙගල්දොරුව දළදා මාළිගාව මුල්ගිරිගල
9) කුසුමාසන දේවිය
10) ඉතාලියේ
11) ලියනාඩෝ ඩා වින්චි
12) ජොහැන්නස් ගුටෙන්බර්ග්
13) වස්කෝ ද ගාමා
14) B C A
15) පර්ඩිනන්ඩ් මැගලන්
16) මැණික්
17) සීතාවක රාජසිංහ රජු
18) දෙන් ජෙරනිමෝ ද අසවේදූ
19) එතෙක් කෝට්ටේ රාජ්‍යයේ පැවති පරිපාලන ක්‍රමය තව දුරටත් ගෙන යා යුතු බව දැක්වෙන ගිවිසුම
20) කුරුඳු

11 - කොටස

1) (අ)




1) ( ආ ) a

i. නෙලුම් පොකුණ ii. පොළොන්නරුවේ iii. මහා පරාක්‍රමබාහු රජු

b

i. වස්කෝ ද ගාමා
ii. පෘතුගීසි
iii. පෙරදිගට පැමිණි මුල්ම යුරෝපා ජාතිකයා වීම

2)

i. a වැව් බැම්ම සෝදි යැම වැලැක්වීම

b වැවේ අතිරික්ත ජලය පිට කිරිම සඳහා ( ලකුණු 2 යි )

ii. a ධාතුසේන රජු

b 1 වන අග්බෝ රජු ( ලකුණු 2 යි )

iii. වැව්වල හෝ ඇමුණු වල සිටවගා බිම් කරා ජලය ගෙන යෑම

අමුණක සිට වැවකට හෝ වැව් පද්ධතියකට ජලය ගෙන යෑම

වැවක සිට වැවකට හෝ වැව් කිපයකට ජළය ගෙන යෑම ( ලකුණු 3 යි )

iv. භූමියේ ස්වභාවය අනුව පරිසරයට ගැළපෙන ලෙස උද්‍යාන සැලසුම් කර තිබීම

උද්‍යානය තුළ සැලසුම් කළ මාර්ග පද්ධතියක් තිබීම රාජසිංහ

ජල කානු පොකුණු ජලමල් ආදිය තනවා උද්‍යානය අලංකාර කර තිබීම

එළිමහන් ගෙවල් මණ්ඩප හා විවේකස්ථාන ආදිය තනවා ගස්වැල් වවා රමණිය පරිසරයක් ඇති කිරිම

උද්‍යාන පාලකයන් යටතේ මනාලෙස උද්‍යාන නඩත්තු කිරිම ( ලකුණු 5 යි )

( මින් කරුණු තුනක් දක්වා ඉන් එකක් විස්තර කළ යුතුය )

3)

i. සෙංකඩගල පුර කන්ද උඩරට උඩරට රාජධානිය කන්දේ නුවර ( ලකුණු 2යි )

ii. a වීර සුන්දර බණ්ඩාර b 1 වන රාජසිංහ රජුට ( ලකුණු 2යි )

iii. ශ්‍රී විජය රාජසිංහ කීර්ති ශ්‍රී රාජසිංහ රාජාධි රාජසිංහ ශ්‍රී වික්‍රම රාජසිංහ ( ලකුණු 3 යි )

iv. නිත්‍යානුකූළ රාජ්‍ය උරුමයක් නොතිබීම සීතාවක රාජධානියෙන් එල්ල වූ අභියෝග පෘතුගිසීන්ගෙන් එල්ල වූ අභියෝග බුදු දහම නගා සිටුවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය ආර්ථිකය නංවාලිමට අවශ්‍ය කටයුතු සිදූ කිරිම ( මින් කරුණු තුනක් දක්වා ඉන් එකක් විස්තර කළ යුතුය ) ලකුණු 5 යි

4)

i. පළමුවන විමල ධර්ම සූරිය රජු සෙනරත් රජු දෙවන රාජසිංහ රජු දෙවන විමල ධර්මසූරිය රජු ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජු මින් දෙදෙනෙකු ලකුණු 2 යි

ii. රන්දෙණිවෙල කොන්ස්තන්තිනූ ද සා ගන්නෝරුව දියෝගෝ ද මේලෝ ලකුණු 2යි

iii. සියම් දේශයෙන් උපසම්පදාව ගෙනඒම වැලිවිට සංඝරාජ හිමියන්ට සංඝරාජ පදවියට පත් කිරීම වෙහෙර විහාර පිළි සකර කිරීම වාර්ෂික දළදා පෙරහැර පැවැත්වීම දළදා පෙරහැරට දේවාල පෙරහැර එකතුකිරිම ( ලකුණු 3 යි )

iv. කෘෂි කර්මය පදනම් කරගත් ආර්ථික රටාව හෙල්මළු ක්‍රමයට සකස්කරගත් කුඹුරු අහස් දියෙන් වගා කිරිම ධාන්‍ය වර්ග හේන්වල වගා කිරිම එළවළු පලතුරු අල වර්ග කොස් දෙල් පුවක් ආදිය ගෙවතුවල වගා කිරීම ගව පාලනය සිදූ කිරීම දේශීය මෙන්ම විදේශිය වෙළෙදාම ද පැවතිම වෙළෙදාමේදී කාසි භාවිතය මෙන්ම භාණ්ඩ හුවමාරු ක්‍රම පැවතිම විදේශීය වෙළෙදාම රජුගේ ඒකාධිකාරිය යටතේ පැවතීම මැටි තඹ පිත්තල යකඩ ලෝහ වැඩ සඳහා ශිල්පින් පරම්පරාවෙන් පරම්පරාවට පැවත එන්නන් වීම කොත්මලේ යකඩ කර්මාන්තය සඳහාත් දූම්බර පන් කර්මාන්තය සඳහාත් ප්‍රසිද්ධ විය ආදී කරුණු ලකුණු 5 කී

5)

i. වැනිසිය ජිනෝවා ප්ලෝරන්ස් මින් දෙකක් ලකුණු 2 යි

ii. a එන්ගලන්තය b ඉතාලිය ලකුණු 2 යි

iii. ලෞකිකත්වයට මූලිකත්වය ලබා දිම රජවරුන් බිසෝවරුන් කුමර කුමරියන් ධනවත් පවුල්වල අය වස්තු විෂය කර ගැනීම නිර්මාණ කර්තෘගේ නමින් එළි දැක්වීම විවිධ ධනවතුන් අනුග්‍රහය දැක්වීම රසවින්දනය මූලික පරමාර්ථය වීම ස්වාධිනව තම දක්ෂතා ඉස්මතු කරමින් නිර්මාණ බිහි කිරිම මින් කරුණු තුනක් ලකුණු 3 යි

iv. විලියම් හාවේ විසින් මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබද වැදගත් තොරතුරු සොයා ගැනීම වෛද්‍ය පැරසල්සස් විසින් ලෙඩරෝග සෑදීමට තුඩුදෙන හේතු හා ඒවාට ප්‍රතිකර්ම පිළිබද අත්හදා බැලීම මයිකල් සර්වෙක්ස් විසින් රුධිරය හදවතේ දකුණු කෝෂයෙන් පිට වී ගොස් පෙනහැලි මගින් පිරිසිදු වී යලිත් හදවතට පැමිණ සිරුර පුරා විසිරී යෑම පිළිබද තොරතුරු සොයා ගැනීම ලකුණු 5 යි

6)

i. පෘතුගාලය ස්පාඤ්ඤය මහා බ්‍රිතාන්‍යය ලකුණු 2 යි

ii. පාතුගාලය ඕලන්දය එන්ගලන්තය ප්‍රංශය ලකුණු 2 යි

iii. මුස්ලිම් වරුන් සතුව පැවති ආසියාවේ වෙළද ආධිපත්‍ය යුරෝපීයන් අතට ගැනීම අළුතින් සොයා ගන්නා රටවල කතෝලික ආගම පැතිරවීම ආසියාවේ නිෂ්පාදනය කෙරුණු කුළුබඩු ඇතුළු වෙළෙද ද්‍රව්‍ය ලබාගෙන යුරෝපයට ගෙනගොස් අලෙවි කොට ලාභ ලැබීම ලකුණු 3 යි

iv. නව විද්‍යාත්මක සොයා ගැනීම් චින්තන විපර්යාසය නිසා දේශගවේෂණයට සුදුසු පසුබිමක් නිර්මාණය වීම නිකලස් කොපර්නිකස් විසින් ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම ටොලමිගේ ලෝක සිතියම මගින් පිහිටිම පිළිබද තිබූ දැනුම පුළුල් වීම දිගු මුහුදු ගමන් වලදී මාර්ගය සොයා ගැනීමට ඉවහල් වන මාලිමාව උතුරු තරු මාපකය ආදිය භාවිතය විශාල නැව් නිපදවීම ලකුණු 5 යි

7)

i. a ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා b ලොරොන්සෝ ද අල්මේදා ලකුණු 2 යි

ii. a අටවන වීර පරාක්‍රමබාහු b සේනා සම්මත වික්‍රමබාහු ලකුණු 2 යි

iii. මායාදූන්නේ හා 1 වන රාජසිංහ යන රජවරුන් රණ ශූරයන් වීම දළදාව සීතාවකට වැඩම කිරීම සීතාවක රජවරුන් අනුගමනය කළ පෘතුගීසි විරෝධි ප්‍රතිපත්ති රයිගම රාජධානිය හා උඩරට රාජධානිය සීතාවකට ඈදා ගැනීම කෝට්ටේ රාජධානිය පරිහානියට පත්වීම
ලකුණු 3 යි

iv.

| අංශය | නවාංග |
|---|---|
| ඇඳුම් | කමිස කලිසම සාය කබාකුරුත්තු |
| ආහාර | පාන් වයින් සලාද අච්චාරු |
| කලාව | යුරෝපීය ආභාසය ලත් ගෘහ නිර්මාණ චිත්‍ර මූර්ති |
| පුද්ගල නම් | කැතරින් ජෝන් සිල්වා පෙරේරා අල්මේදා |
| සංගීතය | බයිලා කපිරිඤ්ඤා |

ලකුණු 5 යි

# LOL.lk
## BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**